පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 492

ආයතනයේ නම: ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඇස්මේන්තු කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 492

நிறுவனத்தின் பெயர்: தேசிய மிருகக்காட்சிசாலை திணைக்களம்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்துக்குச் சமர்ப்பித்தல்

Parliamentary Series No: 492

Name of the institution: Department of National Zoological Department

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආකෘතිය (අංක 01)

පාර්ලිමේන්තු මාලාවේ අංකය : 492

ආයතනයේ නම : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

<u>පළමු කොටස : 94.00</u>

මූල්‍ය නීතිරීති හා කාර්යසාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගන්නා ලද දුර්වලතා	ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හා ඒවායේ වත්මන් තත්ත්වය
පළමු කොටස	
අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	2023 වර්ෂයේ විගණන සැලැස්ම මත පදනම්ව එම වර්ෂයට අදාලව අවදානම් ලේඛණය සකස් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
2020.08.28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1 කොටසේ 11.1 ඡේදයේ සඳහන් කාලරාමුව ඇතුළත මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	කොරෝනා වසංගත තත්ත්වය හමුවේ නියමිත පරිදි ඉටුකිරීමට නොහැකි වූ 2020,2021 හා 2022 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023 වර්ෂයේ අවසන් කරන ලද අතර, 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතුද එම වර්ෂයේ අගභාගය වනවිට අවසන් කෙරිණි. ඉන්පසු සෑම වර්ෂයකම මු.රෙ.756 (6) ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
වාහනයක් ගර්හිත වී මාස 8 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	එම කාල වකවානුව වනවිට රට තුළ උද්ගතව පැවති ආර්ථික තත්වය මත නව වාහන මිලදී ගැනීම අත්හිටුවා, අපහරණය කිරීමට ඉදිරිපත් කර ඇති වාහන අලුත්වැඩියා කර නැවත භාවිතයට ගත හැකි තත්වයට පත්කරගැනීමට හැකි ද යන්න සොයාබලන ලෙස විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වලදී සාකච්ඡාවුවද මේ වනවිට අපහරණය කරන ලෙස දක්වා තිබූ සියළු වාහනවල අපහරණ කටයුතු සිදුකර අවසන් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

දෙවැනි කොටස	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	2020, 2021 වර්ෂවල පැවති කොරෝනා වසංගත තත්වය හමුවේ රට තුළ ආර්ථික වශයෙන් පැවති තත්ත්වය මත අත්‍යවශ්‍ය සේවකයන් ගෙන්වා ගැනීම, සේවා වක්‍ර මත පදනම්ව නිලධාරීන් ගෙන්වා ගැනීම හේතුවෙන් නිවැරදිව ලේඛණ සකස් කිරීමේදී ඇති වූ තත්වයක් හේතුවෙන් සිදුවූ අතර, මේ වනවිට ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය සත්‍ය හා සාධාරණ බවක් පිළිබිඹු කරන මට්ටම දක්වා ඉහළ මට්ටමකට පත්කර ගෙන ඇති බව කාරුණිකද දන්වා සිටිමි.
විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදුකරන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

වෛද්‍ය දම්මික පටබැඳි
පරිසර අමාත්‍ය